5048

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018**

ව්‍යාපාර අධ්‍යයනය - I
**Business Studies - I**

32 S I

පැය දෙකයි
**Two hours**

විභාග අංකයː ..............................................

- ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා පිළිතුරු තෝරා හිස් තැන තුළ අංකය ලියන්න.

(1) පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. මිනිසුන්ගේ විවිධ වුවමනා වෙනුවෙන් ව්‍යාපාරිකයන් අවශ්‍යතා නිර්මාණය කරයි.
2. අවශ්‍යතා ජාතීන් අනුව වෙනස් වුවද වුවමනා සෑම පුද්ගලයෙකුටම පොදු වේ.
3. ව්‍යාපාරිකයන් ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රම භාවිතා කර අවශ්‍යතා වෙළඳපොලට හඳුන්වා දෙයි.
4. ගෝලීය වූ ව්‍යාපාර පසුබිමක් තුළ මිනිසුන්ගේ අවශ්‍යතා වෙනස් වුවද වුවමනා ඒකාකාරීව පවතී.
5. ව්‍යාපාරිකයන් නව භාණ්ඩ හා සේවා නිපදවීම මගින් මිනිස් වුවමනා නිර්මාණය කිරීමට පෙළඹේ. (....................)

(2) පසිඳු, ජනිඳු සහ රවිඳු මිතුරන් තිදෙනෙකි. පසිඳු කෙසෙල් වගා කිරීමේ ගොවිපොළක් පවත්වාගෙන යයි. ජනිඳු නිෂ්පාදිත කෙසෙල් ආශ්‍රයෙන් පළතුරු බීම සෑදීම සඳහා උනන්දුවක් දක්වයි. ඒ සම්බන්ධයෙන් වන වෘත්තීය පාඨමාලාවක් ද හදාරා ඇත. කුඩා ලොරි රථයක් හිමි රවිඳු එම නිෂ්පාදන බෙදා හැරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

පසිඳු, රවිඳු, ජනිඳු සිදුකරන නිෂ්පාදන ව්‍යාපාර අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.
1. කෘෂි කාර්මික නිෂ්පාදනය, සෘජු නිෂ්පාදනය, වක්‍ර නිෂ්පාදනය
2. ප්‍රාථමික නිෂ්පාදනය, ද්විතියික නිෂ්පාදනය, තෘතියික නිෂ්පාදනය
3. තෘතියික නිෂ්පාදනය, ප්‍රාථමික නිෂ්පාදනය, ද්විතියික නිෂ්පාදනය
4. ප්‍රාථමික නිෂ්පාදනය, තෘතියික නිෂ්පාදනය, ද්විතියික නිෂ්පාදනය
5. සෘජු නිෂ්පාදනය, වක්‍ර නිෂ්පාදනය, තෘතීය නිෂ්පාදනය (....................)

(3) ශ්‍රී ලංකාවේ සේවා අංශයේ දායකත්වය ඉහළ යාම සඳහා බලපා ඇති සාධක නිවැරදිව දක්වෙන පිළිතුර වනුයේ,
1. ජීවන රටාව වෙනස් වීම/ ජනග්‍රහනයේ වර්ධනය/ වෙළඳාමේ දියුණුව/වැය කළ හැකි ආදායම ඉහළ යාම.
2. සංචාරක කටයුතු පුළුල් වීම/ ජීවන රටාව වෙනස් වීම/වෙළඳාමේ දියුණුව/වෘත්තීය සේවා සඳහා ඉල්ලුම ඉහළ යාම.
3. විද්‍යුත් වාණිජ්‍යයේ දියුණුව/ ජීවන රටාව වෙනස් වීම/මූල්‍ය ක්ෂේත්‍රයේ දියුණුව/වැයකල හැකි ආදායම ඉහළ යාම.
4. වැය කළ හැකි ආදායම ඉහළ යාම/ ජීවන රටාව වෙනස් වීම/ විද්‍යුත් ව්‍යාපාරවල ව්‍යාපෘතිය/වෘත්තීය සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම.
5. ජීවන රටාව වෙනස්වීම/ වෙළඳාමේ දියුණුව/ ගෝලීයකරණය/ ජනගහණය වර්ධනය. (....................)

(4) පහත දක්වෙන්නේ ව්‍යාපාර පරිසරය අධ්‍යනය කිරීම තුළින් ව්‍යාපාරිකයෙකු හඳුනාගත් අහිතකර තත්වයයන් කිහිපයකි.

A. ඉහළ අධීක්ෂණයක් නොමැති වීම.
B. ස්වභාවික සම්පත් හිඟවීම.
C. නිෂ්පාදනය යල් පැනීම.
D. මනා සම්බන්ධීකරණයක් නොතිබීම.
E. තරඟකාරීත්වය වැඩි වීම.
F. භූමිකා අතර ගැටුම් ඇති වීම.
G. දැනුම හා පළපුරුද්ද අඩු බව.
H. ජනගහනය වර්ධන අනුපාතය අඩු වීම. (....................)

ඉහත දැ අතුරින් අභ්‍යන්තර පරිසරයේ හඳුනාගත හැකි අහිතකර තත්ව ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න,

1. A, C, E හා H ය.
2. A, D, F හා G ය.
3. B, E, G හා H ය.
4. B, E, G හා H ය.
5. C, D, F හා G ය. (....................)

(5) විද්‍යුත් වාණිජය හා විද්‍යුත් ව්‍යාපාර මත පදනම් වූ නූතන දැනුම් ආර්ථිකයේ විශේෂත්වයක් වන්නේ,
1. අන්තර්ජාලය හරහා ව්‍යාපාර කටයුතු සිදු කිරීමයි.
2. ගෝලීය ව්‍යාපාර බිහිවීමයි.
3. විද්‍යුත් මුදල් භාවිතා කරමින් ව්‍යාපාර කටයුතු සිදු කිරීමයි.
4. තොරතුරු මත ව්‍යාපාර පදනම් වී තිබීමයි.
5. ව්‍යාපාර හා ගනුදෙනුකරුවන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව වැඩි වීමයි. (..................)

(6) පහත දැක්වෙන්නේ ව්‍යාපාර ක්‍රියාවලියේ යෙදවුම් නිමවුම් ක්‍රියාවලියට අදාළ සාධකයන් කීපයකි.

A. අතිකාල වැඩ
B. සේවක පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාම
C. උසස් කිරීම
D. සේවකයන් පුහුණු කිරීම
E. සේවකයන් වැඩ කරන කාලය
F. සේවක කුසලතා
G. නව ශිල්පීය ක්‍රම
H. සේවකයන් බඳවා ගැනීම (..................)

ඉහත සඳහන් දෑ අතුරින් ව්‍යාපාරයක මානව සම්පත් කටයුතු ලෙස ඇතුළත් පිළිතුරු කාණ්ඩය වනුයේ,
1. A, B, E, F හා G පමණි.
2. C, D හා H පමණි.
3. A, D, E, F, G හා H පමණි.
4. A, C හා E පමණි. (..................)
5. B, C, G හා H පමණි.

(7) ව්‍යාපාර විසින් ඉටු කළ යුතු සමාජ වගකීම් කීපයක් පහත දැක්වේ.

A. ආර්ථික ප්‍රතිලාභ අත්කර ගැනීම.
B. ආර්ථික වර්ධනයට දායක වීම.
C. සමානාත්මතාවය.
D. හානි අවම කර ගැනීම.
E. අවංකව කළමණාකරණ කටයුතු කිරීම.
F. අපද්‍රව්‍ය කළමණාකරණය.
G. යෙදු සම්පත් ආරක්ෂා කිරීම.
H. අයිතීන් ආරක්ෂා කිරීම.

ඉහත සමාජ වගකීම් අතරින් අයිතිකරුවන්ට හා ගනුදෙනුකරුවන්ට ඉටු කළ යුතු සමාජ වගකීම් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
1. A, E, G හා D, H
2. B, C, D හා D, E, F
3. D, F, G හා A, හා C
4. C, E, G හා A, D, F
5. A, B, F හා C, G, H (..................)

(8) නව බදු පනතට අනුව පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායම වනුයේ,
1. වාර්ෂික මුළු ආදායම රුපියල් ලක්ෂ 5 සිට ය.
2. වාර්ෂික ශුද්ධ ආදායම රුපියල් ලක්ෂ 5 සිට ය.
3. වාර්ෂික මුළු ආදායම රුපියල් ලක්ෂ 10 සිට ය.
4. වාර්ෂික ශුද්ධ ආදායම රුපියල් ලක්ෂ 10 සිට ය.
5. වාර්ෂික ශුද්ධ ආදායම රුපියල් ලක්ෂ 15 සිට ය. (..................)

(9) පහත "A" තීරුවේ වී වගාව සම්බන්ධයෙන් රජය ඉටු කරනු ලබන කටයුතු කිහිපයක් සහ "B" තීරුවේ රජය ව්‍යාපාරවලට බලපෑම් සිදුකරන ආකාර කිහිපයක් දැක්වේ. "A" සහ "B" තීරු නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| "A" | "B" |
|---|---|
| A. වී සඳහා සහතික මිලක් නියම කිරීම. | 1. යටිතල පහසුකම් සැපයීම. |
| B. අස්වනු නෙලන කාලයේදී වී මිලට ගැනීම. | 2. දිරිගැන්වීම් ලබා දීම. |
| C. පොහොර සහනාධාර ලබා දීම. | 3. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. |
| D. මොරගහකන්ද ජලාශය විවෘත කිරීම. | 4. තරඟකරුවන් වීම. |

1. A2, B3, C1, D4
2. A1, B2, C3, D4
3. A4, B3, C2, D1
4. A3, B1, C4, D2
5. A3, B4, C2, D1 (..................)

(10) ශ්‍රී ලංකාවේ බොහෝ ජනාකීර්ණ ප්‍රදේශවල කසල කඳු දැකිය හැකිය. මීතොටමුල්ල කසල කන්ද නාය යෑම නිසා සිදු වූ ජීවිත හා දේපල හානිය ඊට හොඳම උදාහරණයකි. මෙහිදී උල්ලංඝනය වී ඇති පාරිභෝගික අයිතිවාසිකම කුමක්ද?
1. ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතියකි.
2. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතියකි.
3. සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතියකි.
4. සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතියකි.
5. වන්දි ලබා ගැනීමට ඇති අයිතියකි. (..................)

(11) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. සෑම තේවල ස්වාමී ව්‍යාපාරයක්ම 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියා පදිංචි කළ යුතු ය.
2. 1890 හවුල් ආඥාපනත අනුව හවුල් කරුවන් ව්‍යාපාරයට සලසන සේවය වෙනුවෙන් ඔවුන්ට වේතන ගෙවීමට හිමිකමක් ඇත.
3. ඇපයෙන් සීමිත සමාගම්වල සාමාජිකයන්ට ලාභාංශ ගෙවීමක් සිදු නොකරයි.
4. ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ය.
5. ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර සම්බන්ධයෙන් වරලත් ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් හිමිවේ.(...................)

(12) පහත දැක්වෙන්නේ සංස්ථාපිත සමාගම්වලට අදාළ ලක්ෂණ කීපයකි.

A. වගකීම සීමිත වීම.
B. උපරිම සාමාජික සංඛ්‍යාව සීමා සහිත වීම.
C. නෛතික පුද්ගලභාවයක් පැවතීම.
D. අඛණ්ඩව පැවැත්මක් තිබීම.
E. කොටස් හෝ සුරැකුම්පත් ප්‍රසිද්ධයේ නිකුත් කළ හැකි වීම.
F. අවම සාමාජික සංඛ්‍යාව එකක් වීම.
G. අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව දෙදෙනෙකු වීම.

ඉහත ලක්ෂණ වලින් සීමිත පෞද්ගලික හා සීමිත පොදු යන සමාගම් වර්ග දෙකට ම පොදු ලක්ෂණ ඇතුළත් පිළිතුර වනුයේ,

1. A , C , D හා E ය.
2. A , C , D හා F ය.
3. A , B , C හා D ය.
4. A , D , F හා G ය.
5. C, D , F හා G ය. (...................)

(13) ව්‍යාපාර සංවිධාන වර්ග "X" තීරුවේද ඒවාට උදාහරණ "Y" තීරුවේද දක්වා ඇත.

| "X" | "Y" |
|---|---|
| 1. ලැයිස්තුගත පොදු සමාගම. | A. ඒෂියා පැසිපික් සමාගම. |
| 2. ඇපයෙන් සීමිත සමාගම. | B. HSBC බැංකුව. |
| 3. අක්වෙරළ සමාගම. | C. සෙලින්කෝ (PLC) |
| 4. විදේශීය සමාගම. | D. කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව. |

(...................)

ඉහත "X" හා "Y" තීරු නිවැරදිව ගලපා ඇති පිළිතුර වනුයේ,

1. 1B, 2A , 3C, 4D
2. 1A, 2D , 3B, 4C
3. 1C, 2D , 3A, 4B
4. 1D, 2C , 3A, 4B
5. 1C, 2B , 3D, 4A (...................)

(14) පහත දැක්වෙන්නේ සමුපකාර ව්‍යාපාරයේ පවතින සුවිශේෂී ලක්ෂණ සහ සමුපකාර ප්‍රතිපත්ති කිහිපයකි.

A. සාමාජිකයන්ගේ සාමූහික අයිතිය.
B. ස්වෙච්ඡාභාවය හා නිදහස.
C. පොදු අවශ්‍යතා සහ අපේක්ෂාවලින් යුක්ත වීම.
D. ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය.
E. එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් හිමිවීම.
F. සමුපකාර පුහුණුව හා තොරතුරු ලබා දීම.
G. සමාජය පිළිබඳ සැලකිලිමත් වීම.
H. ස්වාධීන සංවිධානයක් වීම.

ඉහත කරුණුවලින් සමුපකාර ප්‍රතිපත්ති පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. B, D , F, G
2. B, D , F, H
3. A, C , E, H
4. A, B , F, H
5. B, D , F, E (...................)

(15) පහත සඳහන් කරුණු අතරින් රාජ්‍ය දෙපාර්තමේන්තුවකට පමණක් අදාළ වන පිළිතුර තෝරන්න.

A. රජය විසින් අරමුදල් සම්පාදනය කරයි.
B. අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පරිපාලනය හා කළමණාකරණය සිදු කරයි.
C. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවයි.
D. ආයතන ප්‍රධානියාගේ නිල නාමයෙන් නෛතික කටයුතු සිදු කළ හැකිය.
E. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි බලපායි.

1. E පමණි.
2. A, C පමණි.
3. A,C,E පමණි.
4. D පමණි.
2. C, D පමණි. (...................)

(16) ව්‍යවසායකයා යන්නට පූර්ණ අර්ථය දෙන ප්‍රකාශය තෝරන්න.
1. ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක ආයෝජනය කරන්නා ව්‍යවසායකයා ය.
2. ව්‍යාපාරයක කළමනාකරණ කටයුතුවල නිරතවන්නා ව්‍යවසායකයාය.
3. ව්‍යාපාරයක ආයෝජනය කර කළමනාකරණ කටයුතුවල යෙදෙන්නා ව්‍යවසායකයා ය.
4. ව්‍යපාර අවදානම්වලට මුහුණ දෙමින් ලාභ ලබන්නා ව්‍යවසායකයා ය.
5. නව්‍යතා තුළින් වෙනසකම් ඇති කරන්නා ව්‍යවසායකයා ය. (...................)

(17) ව්‍යවසායකත්වය මඟින් ජනිත කරන ආර්ථික ප්‍රතිලාභ වන්නේ,
1. නාස්තිය අවම කිරීම හා ව්‍යාපාර තරඟයට අවස්ථා හඳුනාගැනීම.
2. වෙළඳපොල තරඟයට මුහුණ දීම හා අවදානම් දැරීම.
3. අවදානම් දැරීම හා ලාභ ලැබීම.
4. රැකියා අවස්ථා බිහිකිරීම හා ජීවන තත්වය වර්ධනය කිරීම.
5. වැඩට කැපවීම හා සාර්ථක කළමණාකරණයයි. (...................)

(18) පහත දක්වෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් කිහිපයක් පහත දක්වේ.

| "X" | "Y" |
|---|---|
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය | A. විශිෂ්ටතා සම්මාන ලබා දීම. |
| 2. ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) | B. පුහුණු වැඩ සටහන් පැවැත්වීම. |
| 3. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | C. යටිතල පහසුකම් |
| 4. ජාතික ව්‍යවසායකත්ව සංවර්ධණ අධිකාරිය | D. උපදේශන සේවා |
| 5. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | E. අලෙවි පහසුකම් |

1. 1-B, 2-E , 3-C, 4-D, 5-A
2. 1-E, 2-C , 3-B, 4-A, 5-B
3. 1-A, 2-D , 3-C, 4-E, 5-B
4. 1-C, 2-A , 3-E, 4-B, 5-D (...................)
5. 1-D, 2-B , 3-C, 4-D, 5-E

(19) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යයන් කිහිපයක් පහත දක්වේ.
A. මුදල් ප්‍රතිපත්තිය මෙහෙය වීම.
B. විනිමය අනුපාත ප්‍රතිපත්තිය මෙහෙය වීම.
C. ආර්ථික හා මිල ස්ථායිතාවක් පවත්වා ගැනීම.
D. ව්‍යවහර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම.
E. මූල්‍ය ක්‍රමයේ ස්ථිරතාව පවත්වාගෙන යාම.
මේවා අතුරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් වනුයේ,
1. ABC
2. ABD
3. CDE
4. CEA
5. ACE (...................)

(20) X තීරුව මඟින් මූල්‍ය ආයතන කිහිපයක් ද Y තීරුව මගින් එම මූල්‍ය ආයතන අයත් වන්නේ කුමන මූල්‍යාතන ගණයට දැයි දක්වේ.

| "X" | "Y" |
|---|---|
| A. රක්ෂණ සමාගම් | 1. විශේෂිත මූල්‍යායතන |
| B. සමූපකාර ග්‍රාමීය බැංකු | 2. බැංකු අංශය |
| C. කොටස් තැරැව්කරුවන් | 3. තැම්පතු භාරගන්නා අනෙකුත් මූල්‍යායතන |
| D. බලපත්‍රලාභී විශේෂිත බැංකු | 4. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතනය |

මූල්‍ය ආයතන සහ එම මූල්‍ය ආයතන අයත්වන මූල්‍ය ආයතනවල නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
1. A-4, B-3, C-1, D-2
2. A-3, B-4 , C-1, D-2
3. A-4, B-3, C-2, D-1
4. A-1, B-2 , C-4, D-3
5. A-1, B-2, C-3, D-4 (...................)

5054

(21) මූල්‍ය සමාගම් හා සමූපකාර ග්‍රාමීය බැංකු ඉටු කරන කාර්යයන් කිහිපයක් පහත දක්වේ.

A. කල්බදු මූල්‍යකරණය
B. කෙටිකාලීන ණය සැපයීම
C. සාමාජික ඉතිරිකිරීමේ තැන්පතු ගිණුම් පවත්වාගෙන යාම
D. නිෂ්පාදනය, කර්මාන්ත අලෙවි කටයුතු සඳහා ණය සැපයීම
E. කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
F. රජයේ සුරැකුම්පත් වල ආයෝජනය

මේවා අතුරින් මූල්‍ය සමාගමක් ඉටු කරන කාර්යයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ABCE
2. ABEF
3. BCDE
4. CDEF
5. ABCF

(....................)

(22) විද්‍යුත් මුදල් කාඩ්වල දැකිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.

A. නිකුත් කරන ආයතනයේ නම සහ ලාංඡනය
B. කාන්දම් පටිය
C. සන්නම් ලාංඡනය
D. කාඩ්පත් හිමියාගේ නම
E. ත්‍රිමාන චිත්‍රය
F. කාඩ්පත් අංකය
G. අත්සන් පටිය
H. කාඩ්පතෙහි ආරක්ෂිත සංකේතය

මෙහි සඳහන් තොරතුරු වලින් විද්‍යුත් මුදලක ඉදිරිපස ඇතුළත් තොරතුරු වන්නේ,

1. ACDE
2. ACBH
3. ACDF
4. BEGH
5. BDFH

(....................)

(23) විද්‍යුත් මුදල් ගෙවීම් උපකරණ භාවිතයේ දී යොදාගනු ලබන යටිතල පහසුකම් වනුයේ,

1. හර කාඩ්පත්/ ණය කාඩ්පත්
2. ATM යන්ත්‍ර/ විද්‍යුත් පැවරුම්ජාල
3. ටෙලිබැන්කින් සේවය/ චෙක්පත්
4. සංචාරක චෙක්පත්/ බැංකු අණකර
5. පෙර ගෙවුම් කාඩ්පත්/ ණයපත්

(....................)

(24) චෙක්පත් රේඛනය කිරීමට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. චෙක්පත් අන් අයෙකුට පැවරිය නොහැකිය.
2. රේඛනය අවලංගු කළ හැක්කේ අණකරුට හෝ අණ ලද්දාට පමණි.
3. ගනුදෙනු කළ නොහැකිය යන පදය යොදා රේඛනය කළ චෙක් පතක් අන් අයෙකුට පැවරිය නොහැකිය.
4. සාමාන්‍ය රේඛනය සඳහා චෙක්පත මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම අවශ්‍යය.
5. "ආදායකයාගේ ගිණුමට පමණි" යන වගන්තිය සහිත රේඛනයක්, විශේෂ රේඛනයක් වේ.

(....................)

(25) පහත දක්වෙන්නේ රක්ෂණ සමාගමක් විසින් පළ කරනු ලබන ප්‍රචාරණ දැන්වීමක කොටසකි.

"හානියක් සිදුවුවත් නොවුනත් රක්ෂණ මුදල ආපසු ඔබේ අතට, රක්ෂණ මුදලට අමතරව ප්‍රසාද දීමනා, ඔබට වඩාත් හිතැති රක්ෂණ සේවාවක් සඳහා එන්න අප හා එක්වන්න."

මෙම දැන්වීම ඉලක්ක කරනු ලබන රක්ෂණ වර්ගය කුමක් ද?

1. රථවාහන රක්ෂණය
2. ගිනි රක්ෂණය
3. මුහුදු උවදුරු රක්ෂණය
4. ජීවිත රක්ෂණය
5. හදිසි අනතුරු රක්ෂණය

(....................)

(26) ආයතනයක් සන්නිවේදනයට යොදාගන්නා බාහිර ලිඛිත විද්‍යුත් මාධ්‍ය ඇතුළත් වන නිවැරදි පිළිතුර කාණ්ඩය වන්නේ,

1. Fax, E-mail ,විද්‍යුත් දැන්වීම් පුවරු, Sms සේවාව
2. E-mail, ලිපිය, ගැසට්පත්‍රය, Sms සේවාව, හඬ තැපැල
3. දුරකථනය, මෙමෝපත්‍රය, Fax, ශබ්ද විකාශන යන්ත්‍ර
4. සිනුව, බැනර්, පුවත්පත්, වාර්තා, හඬ තැපැල
5. ලිපිය, Fax, බැනර්, පෝස්ටර්, ගැසට් පත්‍රය

(....................)

(27) ප්‍රවාහනයේ සමතුලිත වර්ධනයක් සිදුවීමට ඉටු කළ යුත්තේ,

1. මහා මාර්ග, දුම්රිය මාර්ග හා ඇළ මාර්ග සංවර්ධනයයි.
2. වේගවත් හා සුරක්ෂිත ප්‍රවාහන ක්‍රම හඳුන්වාදීමයි.
3. මාර්ගය, නැවතුම්පොළවල්, රථවාහන හා බලය සංවර්ධනයයි.
4. ප්‍රවාහනය සඳහා බස්, ලොරි රථ, දුම්රිය, ගුවන්යානා ආදිය යෙදවීමයි.
5. ගුවන්තොටුපලවල්, දුම්රිය නැවතුම්පොළවල්, බස් නැවතුම්පොළවල් හා වරායේ පොදු පහසුකම් සංවර්ධනයයි.

(....................)

(28) පහත සඳහන් ඒවායින් ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළ යුතු ආකාරයක් නොවන්නේ,

1. තට්ටු ඇසුරුම් ක්‍රමය
2. භාණ්ඩ ගොඩවල් වශයෙන් ඇසිරීම
3. එහා මෙහා කළ යුතු තට්ටු සහිත රාමු
4. තට්ටු දෙකක් අතර ඇති අමතර තට්ටු
5. ස්වයංක්‍රීය භාණ්ඩ එහා මෙහා කිරීම (....................)

(29) ජාත්‍යන්තර වෙළඳාමට එරෙහිව තීරු බදු, විනිමය පාලන නීති රීති, රේගු නීතිරීති වැනි විවිධ බාධා අවම කර ගැනීමට පිහිටුවාගෙන ඇති ජාත්‍යන්තර සංවාධානයකට අයත් නොවන්නේ පහත සඳහන් කුමන සංවිධානය ද?

1. ලෝක බැංකුව (IBRD)
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
3. ආසියානු සංවර්ධන බැංකුව (ADB)
4. සාර්ක් සංවිධානය (SAARC)
5. යුරෝපීය සංගමය (EU) (....................)

(30) විද්‍යුත් වෙළඳාමෙන් පාරිභෝගිකයාට ලැබෙන වාසියක් නොවන්නේ,

1. භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම.
2. පහසුවෙන් හා ඉක්මණින් ඇණවුම් කළ හැකි වීම.
3. දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම.
4. වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබා දිය හැකි නිසා කීර්තිනාමය හා ලාභය වැඩි වීම.
5. නිෂ්පාදිතයේ මිල මට්ටම සාපේක්ෂව අඩු වීම. (....................)

- 31 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. අ. සෘජු නිෂ්පාදනය තුළින් විශේෂීකරණය ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස .................................... බිහි විය.
ආ. භාණ්ඩ හුවමාරු ක්‍රමය නිසා .............................. හා ................................ ඇති විය.

32. 2017 වාර්ෂික මහ බැංකු වාර්තාවේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශ තුනේ එකතුව .................................. ලෙස දක්වෙන අතර ඊට .................................................................................................................... .................................... එකතු කළ විට වෙළෙඳ පොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය ලැබේ.

33. අ. ප්‍රජා පරිසරය තුළ ජනගහනය ප්‍රමාණය ඉතා වැදගත් සාධකයකි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනගහනය ප්‍රමාණය ................................................................. කි.
ආ. ව්‍යාපාරයේ පරමාර්ථ ලඟා කර ගැනීමට උපකාරී වන බාහිර ගතිලක්ෂණයන් .................................................... ලෙසත් පරමාර්ථ ලඟා කර ගැනීමට බාධාකාරී වන සංවිධානයේ ගතිලක්ෂණ .................................................... ලෙසත් හැඳින්වේ.

(34) අ. ව්‍යාපාරයක හැසිරීම පාලනය කරන නීති හෝ සම්මතයන් .................................................... ලෙස හැඳින්වෙන අතර එය ලිඛිත ව ප්‍රකාශයට පත් කළ විට .................................................... ලෙස හැඳින්වේ.
ආ. පාරිභෝගිකයන් ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව උපරිම වන ආකාරයට කටයුතු කිරීම .................................. වෙනුවෙන් ඇති සමාජ වගකීමක් වන අතර, රැකියා නිර්මාණය කිරීම තුලින් සේවා නියුක්තියට දායක වීම .................................................. වෙත ඇති සමාජ වගකීමකි.

(35) ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුධයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව .................................. වන අතර එහි ප්‍රධාන කොටස් දෙක .................................................... හා .................................... වේ.

(36) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් .................................. සඳහා නව ප්‍රමිතියක් හඳුන්වා දී ඇත. එහි සඳහන් ලාංඡන දෙක වනුයේ .......................... හා .................................... යි.

(37) ව්‍යාපාර සංයෝජන වන ආකාරවලට නිදසුන් ලෙස DFCC බැංකුව හා NDB බැංකුව ඒකාබද්ධ වීම .................................. නමින් හඳුන්වන අතර DSI සමාගම හා මැලිබන් සමාගම එක්ව ව්‍යාපාර කටයුතු කිරීම .................................. වේ.

(38) චෙක්පත් රේඛනය කල හැකි පාර්ශවයන් ලෙස 1. .........................................., 2. .........................................., 3. .................................... හැඳින්විය හැකි අතර රේඛනය අවලංගු කල හැකි පාර්ශ්වය වනුයේ 4. .................................... පමණි.

(39) වෙනත් පාර්ශ්වයකට සිදුවන පාඩු පිළිබඳව රක්ෂණය කිරීම .................................... ලෙස හැඳින්වෙන අතර එම රක්ෂණය 1. ............................................, 2. ............................................, 3. ............................................ ඔප්පු වර්ග ලබා ගත හැකිය

(40) ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීමේ දී 1. ....................................., 2. ............................................
3. ............................................ 4. ............................................ යන උපකරණ භාවිතා කරනු ලබයි.

- 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.

(41) අ. ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් දෙකක් නම් කරන්න.
1. .................................................................. 2. ..................................................................
ආ. ව්‍යාපාරයකට ප්‍රායෝගික ව පාලනය කල නොහැකි අවදානම් දෙකක් ලියන්න.
1. .................................................................. 2. ..................................................................

(42) පහත ප්‍රකාශ සඳහා ගැළපෙන ඇල්මැති පාර්ශ්ව පිළිවෙළින් සඳහන් කරන්න.
1. රැකියා අවස්ථා ලබා ගැනීමට හා සේවා නියුක්තිය වර්ධනය කිරීමට බලාපොරොත්තුවන පාර්ශවයන් වන්නේ,
..................................................................................................................................................................
2. ගුණාත්මක නිෂ්පාදන ලබාගැනීමට හා ඇප සුරැකුම්වල සුරක්ෂිත බව කහවුරු කිරීමට අදාළ පාර්ශවයන් වන්නේ,
..................................................................................................................................................................

(43) අ. ප්‍රතිචක්‍රීකරණය කිරීම ආකාර දෙක දක්වා නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න.
1. ..................................................................................................................
2. ..................................................................................................................
ආ. ව්‍යාපාර කටයුතු නිසා ඇතිවන අහිතකර බලපෑම දෙකක් සඳහන් කරන්න.
1. ..................................................................................................................
2. ..................................................................................................................

(44) පහත සඳහන් ප්‍රමිති පිරිනමන ක්ෂේත්‍ර දක්වන්න.
1. HACCP - ..................................................................................................................
..................................................................................................................
2. OHSAS18001 - ..................................................................................................................
..................................................................................................................
3. GMP - ..................................................................................................................
..................................................................................................................
4. ISO27000 - ..................................................................................................................
..................................................................................................................

(45) ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ ප්‍රධාන ආයතන 3ක් සඳහන් කරන්න.
1. .................................................................. 2. ..................................................................
3. ..................................................................

(46) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ අදියර 5කි. ඉන් මුල් අදියර 4 අනුපිළිවෙළින් දක්වන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

(47) ශ්‍රී ලංකාවේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ පාන ගැටලු 4ක් නම් කරන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

(48) පහත සඳහන් ගනුදෙනු මුදලේ කුමන කාර්යයක් ඉටු කරනු ලබයි ද?

| ගනුදෙනුව | කාර්යය |
|---|---|
| 1. වරාය සේවකයෙකුට රුපියල් 80 000 ක වැටුපක් ලැබීම. | ........................ |
| 2. රුපියල් 85 000 කට රූපවාහිනියක් මිලදී ගැනීම. | ........................ |
| 3. සුරංග පසුගිය වර්ෂයේ එරංග ගෙන් ගත් රුපියල් 50 000ක ණය මේ වර්ෂයේ පියවීම. | ........................ |
| 4. ප්‍රියංකා වාණිජ බැංකුවක ඉතිරුම් ගිණුමක මුදල් තැන්පත් කිරීම | ........................ |

(49) පහත සඳහන් කරුණුවලින් පිළිබිඹු වන හොඳ මුදලක් සතුව පවතින ලක්ෂණ එක් එක් කරුණ ඉදිරියේ ලියන්න.

| | |
|---|---|
| 1. මුදල් නෝට්ටුවල දිය සලකුණු, සැඟවුණු සලකුණු, අංක ආරක්ෂිත නූල, විශේෂ වර්ණ අන්තර්ගත වීම. | ........................ |
| 2. මහ බැංකු අධිපති ගේ, මුදල් ඇමති ගේ අත්සන් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කිරීම. | ........................ |
| 3. ඉතා විශාල අගයක් නෝට්ටු වලින් සහ කාසි වලින් ඉතා කුඩා අගයක් වුවද ගෙවිය හැකි වීම. | ........................ |
| 4. මුදල් නෝට්ටුවල විවිධ වර්ණ හා විවිධ සංකේත යොදා තිබීම. | ........................ |

(50) විද්‍යුත් වෙළඳාම සිදු කරන ආකාර 4ක් දක්වන්න.

1. ........................................

2. ........................................

3. ........................................

4. ........................................

5035

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
குல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜீலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018**

ව්‍යාපාර අධ්‍යයනය II
**Business Studies II**

32 S II

පැය දෙකයි
**Two hours**

විභාග අංකයː ......................................................

- උපදෙස් : එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

(01) i. (අ) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙකක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ආ) වෙළඳාමේ අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය හා වර්තමාන ස්වරූපය පිළිබඳ සැසඳීමක් කරන්න. (ලකුණු 4)

ii. ව්‍යාපාර ලෝකය තුළ විවිධ අරමුණු පෙරදැරි කරගත් ව්‍යාපාර සංවිධාන ක්‍රියාත්මක වේ. ඒවා ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන හෝ ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන විය හැකි ය. ව්‍යාපාර සංවිධානයක අරමුණ කුමක් වුවත් ලාභය සෑම ව්‍යාපාර සංවිධානයකට වැදගත් වීම කෙරෙහි බලපාන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. (අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක හා ආසන්න පරිසර සාධක හතර බැගින් නම් කරන්න.

(ආ) ඔබ නම් කර අභ්‍යන්තර පරිසර සාධකයක් හා ආසන්න පරිසර සාධකයක් ගෙන ඒවා ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ආකාරය වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. (අ) වර්තමානයේ කාන්තාවන් රැකියා සඳහා යාමේ ප්‍රවණතාවය වැඩි වී තිබේ. කාන්තාවන් රැකියා සඳහා යාම නිසා ව්‍යාපාරික අවස්ථා උදාවන ව්‍යාපාර ආයතන නම් කරන්න.

(ආ) සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇතිකිරීම් තුළින් ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑම් ඇති කරන ආකාරය පෙන්වීම සඳහා සුදුසු නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 4)

v. ව්‍යාපාර ආයතන අතර පවත්නා දැඩි තරඟකාරීත්වය නිසා සෑම ව්‍යාපාර ආයතනයක් ම ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන් වෙනුවෙන් ආචාරධර්ම පිළිපැදීමට දක්වන උනන්දුව වැඩි වී තිබේ. මෙලෙස ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාරයකට කෙසේ වැදගත් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

(02) i. පහත දැක්වෙන්නේ මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරනු ලබන ව්‍යාපාර ආයතන දෙකකි.

A. "තරුවී" බේකරි නිෂ්පාදන ව්‍යාපාරය

B. "සඳලී" නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාර

ඉහත ව්‍යාපාර ආයතන දෙකෙන් ඔබ කැමති ව්‍යාපාර ආයතනයක් සැලකිල්ලට ගෙන පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(අ) ඔබ තෝරාගත් ව්‍යාපාරය විසින් ඉටුකරන අවශ්‍යතා හා වුවමනා මොනවාද?

(ආ) ඔබ තෝරාගත් ව්‍යාපාරය නිපදවන එක් නිෂ්පාදනයක් උදාහරණ ලෙස ගෙන සම්පත්වලට අගයක් එකතුවන ආකාරය වටිනාකම් සහිතව දක්වන්න.

(ඉ) එම ව්‍යාපාර ආයතනයේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

(ඊ) ඔබ තෝරාගත් ව්‍යාපාරයෙන් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභයන් මොනවාද? (ලකුණු 4)

ii. රජය විදුලි සංදේශ සේවා සැපයීම මගින් ඩිජිටල් අලෙවිකරණ ක්‍රමවේදයන් ඔස්සේ පුද්ගලයන්ට වෙළඳපොළට ප්‍රවේශවීමට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම නිසා තොරතුරු හා සන්නිවේදන කටයුතුවල ව්‍යාප්තිය වැඩිවී දළ දේශීය නිෂ්පාදිතයේ සේවා අංශයේ දායකත්වය ඉහළ යාමක් සිදුවිය. මෙලෙස සන්නිවේදන පහසුකම් සැපයීම මගින් රජය අපේක්ෂා කරන ප්‍රතිලාභයන් මොනවාද?

iii. "ඛනිජ තෙල් හිඟය ලෝක අර්බුදයක් බවට පත් වී හමාර ය. මේ නිසා වර්තමානයේ ඛනිජ තෙල් මිල සීඝ්‍රයෙන් ඉහළ යාම කිසිවෙකුට පාලනය කළ නොහැකි පාරිසරික සාධකයක් බවට පත්ව ඇත."

(අ) ඉහත ප්‍රකාශනයේ දැක්වෙන සාර්ව පරිසර බලවේග මොනවාද?

(ආ) ඛණිජ තෙල් මිල වැඩිවීම ව්‍යාපාරිකයාට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. "ව්‍යාපාර ආයතනයකට තම ගණුදෙනුකරුවන් වෙනුවෙන් සමාජ වගකීම් ඉටු කිරීම තුළින් ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කරගත හැකිවේ." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු සහිතව පැහැදිලි කරන්න.

v. (අ) 1. ඔබ කැමති ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එම ව්‍යාපාර ආයතනය විසින් සමාජය වෙත ඉටු කරනු ලබන සමාජ වගකීම් දෙකක් නම් කරන්න.

2. එම සමාජ වගකීම් ඉටු කිරීම තුළින් ව්‍යාපාර ආයතනයකට ලැබෙන ප්‍රතිලාභයන් දෙකක් දක්වන්න.

(ආ) "ලක්දිව හරිත ඇසුරුම් ව්‍යාපාරය" පරිසර හිතකාමී බව ඇතිකර ගැනීමට මූලිකත්වය දී කටයුතු කරන ව්‍යාපාරයකි. එම ව්‍යාපාර ආයතනය පරිසර හිතකාමී ආරක්ෂණය තහවුරු කිරීම වෙනුවෙන් ඉටුකරනු ඇතැයි සිතිය හැකි ක්‍රියාකාරකම් දෙකක් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(03) i. සාදයක දී හමුවූ මිතුරන් සිව් දෙනෙකු තම ව්‍යාපාරික කටයුතු පිළිබඳව සිදුකළ සාකච්ඡාවක් පහත දක්වේ.

දයාන් - මගේ බිස්නස් නම් දැන් හොඳටම බැහැලා. පාඩු පිට තමයි දුවන්නේ.

සචින් - දෙවියන්ගේ පිහිටෙන් මට එහෙම ප්‍රශ්නයක් නම් නැහැ. මම බලාපොරොත්තු වුනු මට්ටමට බිස්නස් එක ගේන්න පුළුවන් වුනා. ලාභයත් මගේ ඉලක්කයටම දැන් කිට්ටුවෙලා.

ඉෂාන් - මට තියෙන ප්‍රශ්නෙ මේකයි. මම බිස්නස් එක පටන් ගන්න කොට හිටියෙ මම විතරයි. කිසිම කරදරයක් නැතිව බිස්නස් එක කරගෙන ගියා. ඒත් දැන් මගේ මාර්කට් එකට තව කීප දෙනෙක්ම ඇවිත් ඉන්නවා.

මහේෂ් - අපේ කම්පැණි එකක් දැන් හොඳ මට්ටමකට ඇවිත් තියෙන්නේ. අපේ ඊළඟ බලාපොරොත්තුව තියෙන්නේ share market එකේ ටිකක් උඩට එන එක තමයි.

(අ) ඉහත සාකච්ඡාව තුළින් එක් එක් ව්‍යාපාරිකයා ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ නිවැරදිව දක්වන්න. (ලකුණු 2)

(ආ) රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවත්වා ගැනීම වැදගත් වේ. පැහැදිලි කරන්න. (ලකුණු 2)

ii. (අ) රජයේ බදු ආදායම් වර්ග කර එක් එක් වර්ගයට උදාහරණ දක්වන්න. (ලකුණු 2)

(ආ) පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ප්‍රධාන ආයතන 2ක් නම් කරන්න. (ලකුණු 2)

iii. හසිත වාණිජ අංශයෙන් උසස් පෙළ සමත් වුවත් විශ්ව විද්‍යාලයට යාමට තරම් ලකුණු ප්‍රමාණවත් නොවීය. පියාගේ රෝගී තත්වය නිසා පියා විසින් පවත්වාගෙන ගිය සිල්ලර වෙළඳ ව්‍යාපාරය හසිතට බාරවිය. පියා සාම්ප්‍රදායිකව සිදුකළ ව්‍යාපාරික කටයුතු හසිත තමා ඉගෙනගත් ව්‍යාපාරය හා සම්බන්ධ දැනුම සමඟ පුළුල් කිරීමට කටයුතු කරන ලදී. මුලින්ම ඔහුට අවශ්‍ය වූවේ ව්‍යාපාරයට ආකර්ශනීය නාමයක් යොදා ගැනීමයි.

(අ) ව්‍යාපාර නාමය යෙදීම සම්බන්ධ නෛතික තත්වය කුමක්ද? (ලකුණු 1)

(ආ) හසිත විසින් ව්‍යාපාරයට ලියාපදිංචි කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය කුමක්ද? (ලකුණු 3)

iv. (අ) 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව සංස්ථාපිත සමාගම් වර්ගීකරණය රූප සටහනකින් දක්වන්න.

(ආ) කේවල ස්වාමී ව්‍යාපාරයකට වඩා හවුල් ව්‍යාපාරයක තිබෙන වාසි මොනවා ද? (ලකුණු 2)

v. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාර වලට වැදගත් වන්නේ කෙසේ ද? (ලකුණු 4)

(04) i. පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| නිර්ණායක | සීමිත පෞද්ගලික සමාගම් | සීමිත පොදු සමාගම් |
|---|---|---|
| 1. සාමාජික සංඛ්‍යාව | | |
| 2. වගකීම | | |
| 3. ප්‍රාග්ධන සම්පාදනය | | |
| 4. පරිපාලනය හා කළමණාකරණය | | |

(ලකුණු 4)

ii. සන්නිවේදන මාධ්‍යයන් තුළින් දිනපතා අසන්නට හා දකින්නට ලැබෙනුයේ වෙළඳුන් විසින් සිදු කරනු ලබන විවිධ වූ පාරිභෝගික විෂමාචාරයන් එය පාරිභෝගික ආරක්ෂණයට ඉමහත් තර්ජනයකි.

වර්තමානයේ දී පාරිභෝගික ආරක්ෂණය අවශ්‍ය වීමට බලපා ඇති හේතු මොනවාද? (ලකුණු 4)

iii. වර්තමානයේ බොහෝ සිල්ලර වෙළඳසැල් නවීකරණය වෙමින් ව්‍යාපාරික කටයුතු සිදු කළත්, තවමත් සමූපකාර සිල්ලර වෙළඳසැල් නවීකරණය වෙනුවෙන් ඉතා මන්දගාමීවයි. එය පාරිභෝගිකයා සමූපකාරයෙන් ඈත් කරවීමට හේතු වී ඇත.

සමූපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා ගත හැකි යෝජනා 4ක් දක්වන්න. (ලකුණු 4)

iv. අ. රාජ්‍ය දෙපාර්තමේන්තු ව්‍යාපාර කටයුතු සඳහා යෝග්‍ය නොවේ. හේතු දක්වන්න. (ලකුණු 2)

ආ. රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ 2ක් දක්වන්න. (ලකුණු 2)

v. පියා විසින් ගෙනවිත් තිබූ ජෑම් බෝතලය අතට ගත් රුවිනි එහි තිබූ ලේබලය කියවන්නට විය. නමුත් ලේබලය මත මිල වෙනස්කර ස්ටිකරයක් අලවා තිබෙනු දකින ලදී.

රුවිනි - තාත්තේ මේ ජෑම් බෝතලේ ලේබලය උඩින් ස්ටිකරයක් අලවලානේ දැක්කේ නැද්ද?

තාත්තා - කොහොම දකින්නද? ඒ කඩේ මුදලාලිමනෙ මට ඔය ජෑම් බෝතලේ තෝරලා දුන්නේ. අලුතින් ම ආපු ජෑම් වර්ගයක් කිව්වේ.

අ. ඉහත සිද්ධියට අනුව කඩවී ඇති පාරිභෝගික අයිතිවාසිකම් 2ක් ලියන්න. (ලකුණු 2)

ආ. මෙම සිද්ධියට අනුව රුවිනිගේ පියා තුළ නොතිබූ පාරිභෝගික වගකීම් 2ක් ලියන්න. (ලකුණු 2)

## II කොටස

(05) i. සුනන්ද තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටී. ඔහුට තම ව්‍යාපාරය අසාර්ථක වේද යන බියක් පවතී. තමාට ව්‍යාපාරය කරගෙනයාමට හැකියාව හා කුසලතාව පවතී ද යන ගැටලුවට ඔහු මුහුණ දී තිබේ. ඔහු තුළ ව්‍යවසායකත්ව කුසලතා හා හැකියාවන් වර්ධනය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ඔබ විසින් ලබා දෙන්නේ කෙසේද? (ලකුණු 4)

ii. ව්‍යවසායකයා යනු සුවිශේෂ පුද්ගලයෙකි. පවත්නා දේ වෙනස් කරමින්, ව්‍යාපාර ආරම්භ කරමින් ආර්ථික වර්ධනය සඳහා ඉහළ මට්ටමේ දායකත්වයක් ලබා දේ.

අ. ව්‍යවසායකයින් තුළින් ආර්ථික වර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

i. ව්‍යාපාර නිර්මාණය (ලකුණු 1)

ii. හරිත ව්‍යවසායකත්වය (ලකුණු 1)

iii. අ. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවර්ධනයට ව්‍යවසායකයින් ගේ හිඟකම බාධාවක් වී ඇත. මෙම ප්‍රකාශය පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 2)

ආ. කුඩා ව්‍යාපාර බොහෝමයක් ආරම්භ වන්නේ ස්වයං රැකියා ස්වරූපයෙනි. ස්වයං රැකියාවල වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න. (ලකුණු 2)

iv. අ. ව්‍යවහාර මුදල් හා බැංකු මුදල් අතර පවතින වෙනස් කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ආ. හර පතකින් ගනුදෙනු කරනවා ට වඩා ණය පතකින් ගනුදෙනු කිරීමේ වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න. (ලකුණු 2)

v. වර්තමානයේ ව්‍යවහාර මුදල් භාවිතයට වඩා විද්‍යුත් මුදල් භාවිතය ජනප්‍රිය වෙමින් පවතී. මෙම මුදල් වර්ග හඳුන්වා එසේ විද්‍යුත් මුදල් ජනප්‍රිය වීමට හේතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(06) i. අ. වර්තමානයේ විශාල වශයෙන් ව්‍යාපාරිකයින් දැකිය හැකි වුව ද එම සියලු දෙන ව්‍යවසායකයින් නොවේ. මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. ව්‍යවසායකත්වයේ පුද්ගල ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. සුළු පරිමාණයේ ව්‍යාපාරවලට පහත සඳහන් සේවාවන් සපයන ආයතන බැගින් ලියන්න.

i. මූල්‍ය පහසුකම් සපයන ආයතන

ii. තාක්ෂණික පහසුකම් සපයන ආයතන

iii. උපදේශන සේවා සපයන ආයතන

iv. යටිතල පහසුකම් සපයන ආයතන. (ලකුණු 4)

iii. අ. ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවට සුළු ව්‍යාපාර වැදගත් වන්නේ ඇයි දැයි හේතු 4ක් දක්වන්න.

ආ. රටක රැකියා සැපයීම කෙරෙහි ව්‍යවසායකත්වය දායක වන්නේ කෙසේ ද එය පැහැදිලි කරන්න. (ලකුණු 2)

iv. අ. බැංකු ණයක් හා බැංකු අයිරාවක් අතර පවතින වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 2)

ආ. ව්‍යාපාරික සිරිමල් නිතරම තම ගනුදෙනු පියවීම සිදු කරනුයේ ව්‍යවහාර මුදලින් ය. මුදලින් ගෙවීමේ අවදානමක් පවතින බව බිරිඳ රමණී නිතරම සිරිමල්ට පවසයි. ව්‍යවහාර මුදලින් ගෙවීම් අවදානම පැහැදිලි කර දෙමින් වෙනත් විකල්පයක් හඳුනාගැනීමට සිරිමල්ට උපදෙස් දෙන්න. (ලකුණු 2)

v. අ. "චෙක්පත ගනුදෙනු කළ හැකි උපකරණයකි." මෙම ප්‍රකාශනයේ අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ. ඉහත ප්‍රකාශය පහත සඳහන් දේ සම්බන්ධයෙන් කොතෙක් දුරට වලංගු වේද?

1. රේඛනය කරන ලද චෙක්පත්

2. විධාන චෙක්පත්

(07) i. අ. පහත සඳහන් වන්නේ සී/ස. ABC පෞද්ගලික සමාගමට අදාළ සිදුවීමකි.

සී/ස ABC පෞද්ගලික සමාගම 2018 08 06 වන දින පැවැත්වීමට නියමිතව ඇති ක්ෂේත්‍ර නිලධාරීන් සහභාගි කරවන ලෙස සැලසුම් අධ්‍යක්ෂක විසින් සියලු ම අංශ ප්‍රධාන කළමණාකරුවන් වෙත ලිපියක් මගින් දැනුම් දුන් අතර එම අංශවල සියලු ම ක්ෂේත්‍ර නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් කර අවශ්‍ය කටයුතු සූදානම් කළ බව සියලු ම කළමණාකරුවන් විසින් සලසුම් අධ්‍යක්ෂක වෙත E - mail පණිවුඩයක් මගින් දැනුම් දෙන ලදී.

ඉහත සිද්ධියට අදාළ සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගවලට උදාහරණ සහිතව සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනක දක්වන්න. (ලකුණු 4)

ii. අ. ප්‍රවාහනය යනු සාමාජීය අවශ්‍යතාවයකි. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

ආ. නුවරඑළියේ සිට කොළඹට එළවළු ප්‍රවාහනය කරන තවලම්සේන මහතා තම ප්‍රවාහන සේවාව වසර අටක කාලයක් පවත්වාගෙන යයි. ඔහු පවසන ආකාරයට කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් කෙරෙහි විවිධ කරුණු බලපායි. එසේ ප්‍රවාහන සේවාවක කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන හේතු මොනවාද? (ලකුණු 4)

iii. අ. ශ්‍රී ලංකාවේ මහා මාර්ග, මගී ප්‍රවාහන ක්‍රමය දියුණු කිරීමට රජය විසින් මෑතකදී ගත් ක්‍රියාමාර්ග මොනවාද?

ආ. කසුන් බේකරි හිමියෙකි. බේකරි නිෂ්පාදන බෙදා හැරීම සඳහා ඔහු විසින් බෙදාහැරීමේ වෑන් රථ දෙකක් මිලදී ගන්නා ලදි. කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම ඔහුගේ අරමුණයි.

කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයාටත්, පාරිභෝගිකයාටත් අත්වන ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 4)

iv. ලෝකයේ කිසිදු රටකට වර්තමානයේ හුදකලාව ජීවත් විය නොහැකිය. ඒ අනුව විදේශ වෙළඳාමට සියලු රටවල් සම්බන්ධ වී ඇත. එලෙස විදේශ වෙළඳාමට සම්බන්ධ වීමට පදනම් වී ඇති සාධක හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. නිමල් පෙරේරා සරිෆ් අහමඩ් සමඟ එක්වී හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර දේශීය විදේශීය රෙදිපිළි අලෙවි සැලක් පවත්වාගෙන යාමට අදහස් කරයි. ඔවුන් මුල්ම විදේශීය රෙදිපිළි තොගය ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමට අදහස් කරයි. මීට අදාළ ක්‍රියාපටිපාටිය කෙටියෙන් දක්වන්න. (ලකුණු 4)

(08) i. සන්නිවේදන කටයුතු බහුල වශයෙන් ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගත්තද එය සාමාජීය කටයුතු සඳහා ඉතා වැදගත් වේ. සන්නිවේදනය සාමාජීය කටයුතු සඳහා දක්වන වැදගත්කම කරුණු 4ක් ආශ්‍රයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. අ. පහත දක්වෙන්නේ එක්තරා ව්‍යාපාරයක් පලකළ දැන්වීමකි.

> මාණ්ඩලික කළමණාකරුවන් බඳවා ගැනේ.
>
> ඔබගේ අයදුම් පත දින 15ක් ඇතුලත යොමුකරන්න.
>
> විමසීම් : විධායක අධ්‍යක්ෂ
>
> අංක 30, වෛද්‍ය පාර, ගල්කිස්ස.

ඉහත දැන්වීම් උල්ලංගනය වී ඇති ඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග 4ක් නම් කර පැහැදිලි කරන්න.

ආ. ලිඛිත සන්නිවේදනයේ වාසි හා අවාසි 2 බැගින් නම් කරන්න. (ලකුණු 4)

iii. අ. පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම සඳහා විවිධ මාර්ග යොදාගත හැක. එවැනි මාර්ග 4ක් රූප සටහනකින් දක්වන්න.

ආ. වෙළඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමෙන් ඇතිවන වාසියක් හා අවාසියක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. අ. ඔබේ ප්‍රදේශයේ දැකිය හැකි සිල්ලර වෙළඳසැලක් උදාහරණයට ගෙන එහි දැකිය හැකි සිල්ලර වෙළඳාමේ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ. වර්තමානයේ සිල්ලර වෙළඳාමේ විවිධ ප්‍රවනතා රාශියක් දැකිය හැකිය. එවැනි ප්‍රවනතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. අ. වර්තමානයේ විදේශීය වෙළඳාමේ ප්‍රවනතා රාශියක් දැකිය හැකිය. එවැනි ප්‍රවනතා 4ක් නම් කරන්න.

ආ. විදේශ වෙළඳාමේ වාසි මෙන් ම සීමා ද දැකිය හැකිවේ. එවැනි සීමා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)